## 246 මා තුළට වඩින්නට

මා තුළට වඩින්නට ඔබ සමිඳේ
ගැති වූ මා නම් සුදුසු නොවේ
එක වදන් බිඳක් පැවසුව සැගේ
දසු ඔබෙ සුවපත් වේ

සකේවුසුන්ගේ දොරට පවා
යන්නට ඔබ නම් සතුටු වුණා
ඔහුට කතා කොට සුව කෙරුවා
ගෙදොරට ගැලවීමද පැතුවා

පරිසියගේ නිවහනට වුවත්
වැඩම කළෝ ඔබ නැතිවැ සැකක්
මරියාවන් පවුකාර කමත්
දුරුකොට නිව්වා පිපාසයත්

කානා නුවරේ මගුල් දිනේ
හිමි ඔබට ද ඇරයුම් ලැබුණේ
ඔබ ගිය නිසායැ ගෙය පිරුණේ
ඇති වූ හිගකම් මග හැරුණේ